මගේ අංකය: JSC/SEC/CIR/2020

**සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත,**

**<u>නඩු භාණ්ඩ ආපසු රැගෙන යාම කඩිනම් කිරීම සම්බන්ධව</u>**

උක්ත ශීර්ෂය යටතේ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ රස පරීක්ෂක ජී.රමනා මහත්මිය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙතත් අධිකරණ අමාත්‍යාංශය මගින් මා වෙතත් යොමුකර ඇති අංක GAD/AD/01/20 හා 2020.12.07 දිනැති ලිපිය පිළිබඳව සලකා බලන ලදුව එම ලිපිය සහ ප්‍රශ්නගත කාරණයට අදාලව අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් මීට පෙර නිකුත් කර ඇති (ඇමුණුම් 01 සහ 02 ) ලිපි අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි සුදුසු කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක්කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි ,

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2020 දෙසැම්බර් මස 14 දින
කොලඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

12/7-

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்
GOVERNMENT ANALYST'S DEPARTMENT

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.
இல. 31, இசுரு மாவத்தை, பெலவத்த, பத்தரமுல்ல.
No. 31, Isuru Mawatha, Pelawatta, Battaramulla.
SRI LANKA.

දුරකථන / தொலைபேசிகள் / Telephones: 011 - 2786395, 011 - 2176800
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2786394
E-mail : govanalyst@sltnet.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | GAD/AD/01/20 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2020.12.01 |

ලැබුණා
① 08 DEC 2020
අතිරේක ලේකම් (නීති)

RECEIVED
07 DEC 2020
Secretary's Office
Ministry of Justice

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය.

<u>නඩු භාණ්ඩ ආපසු රැගෙනයාම කඩිනම් කිරීම.</u>

දෙපාර්තමේන්තුව තුල මත් ද්‍රව්‍ය අංශයට අදාල මත්කුඩු, ගංජා ඇතුළු නඩු භාණ්ඩ ගබඩා කර ඇති ගබඩාවල දැනට ඉඩකඩ ඉතාම සීමිත තත්ත්වයට පත්ව ඇත.

02. මෙම දිනවල විශාල ප්‍රමාණයෙන් මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගනු ලබන බව මාධ්‍යය මගින් දැනගන්නට ලැබී ඇති අතර ඊට අදාල නඩු භාණ්ඩ ඉදිරි දිනවල මෙම දෙපාර්තමේන්තුවට රැගෙන ඒමට බොහෝ දුරට ඉඩ ඇත..

03. දැනට තිබෙන ගබඩා පහසුකම් සීමිත වන අතර මෙම නඩු භාණ්ඩ ගබඩා කර තබා ගැනීමට ගැටළු ඇතිවීමට ඉඩ ඇති බැවින් මේ වනවිට පරීක්ෂණ වාර්තා අධිකරණය වෙත යවා අවසන් කර ඇති නඩුවලට අදාල නඩු භාණ්ඩ හැකි ඉක්මනින් රැගෙන යාම සඳහා අදාල අංශ දැනුවත් කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි..

ජී.රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක

ජී. රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක

පිටපත - පොලිස්පති - කරු. දැනගැනීම පිණිස සහ අවශ්‍ය කටයුතු සඳහා
පොලිස් මූලස්ථානය

ඇමුණුම - (01)

මගේ අංකය : JSC/SEC/CIR/2019

සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් හා අධිකරණ නිලධාරීන් වෙත

<u>පරීක්ෂණ කටයුතු සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවෙන</u>

<u>අන්තරායකර ඖෂධ ගණයට අයත් වන්නා වූ නඩු භාණ්ඩ</u>

ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/L/72/2018 හා 2019.07.22 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අන්තරායකර ඖෂධ ගණයට අයත් වන්නා වූ නඩු භාණ්ඩ පරීක්ෂණ කටයුතු සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවා ඊට අදාල <u>රස පරීක්ෂක වාර්තා ලැබීමෙන් මාස දෙකක් ඉකුත් වීමට ප්‍රථම</u> එසේ පරීක්ෂණ සඳහා යවන ලද නඩු භාණ්ඩ නැවත අදාල අධිකරණය වෙත ගෙන්වා ගැනීමට පුද්ගලිකව ඔබගේ අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙස ඔබට දැන්වීමට මට නියම කර ඇත.
අදාල ලිපියේ පිටපතක් මීට අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2019 ඔක්තෝබර් මස 29 දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ඇමුණුම - (02)

JSC/SEC/CIR/2019 2019.10.29

පොලිස්පති /වැඩබලන පොලිස්පති මගින්

අධ්‍යක්ෂ, පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය

<u>පරීක්ෂණ කටයුතු සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවෙන අන්තරායකර ඖෂධ ගණයට අයත් වන්නා වූ නඩු භාණ්ඩ</u>

1. ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/L/72/2018 හා 2019.07.22 දිනැති ලිපිය පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අන්තරායකර ඖෂධ ගණයට අයත් වන්නා වූ නඩු භාණ්ඩ පරීක්ෂණ කටයුතු සඳහා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත යවා <u>ඊට අදාල රස පරීක්ෂක වාර්තා ලැබීමෙන් මාස දෙකක් ඉකුත් වීමට ප්‍රථම එසේ පරීක්ෂණ සඳහා යවන ලද නඩු භාණ්ඩ නැවත අදාල අධිකරණය වෙත ගෙන්වා ගැනීමට</u> පුද්ගලිකව අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙස සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් හා අධිකරණ නිලධාරීන් වෙත දැනටමත් දන්වා යවා ඇත.

2. එසේම පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය මගින් සෘජුවම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරෙන ඉහත ගණයේ නඩු භාණ්ඩ සම්බන්ධයෙන්ද අදාල <u>රස පරීක්ෂක වාර්තා ලැබීමෙන් මාස දෙකක් ඉකුත් වීමට ප්‍රථම එකී නඩු භාණ්ඩ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් රැගෙන අදාල අධිකරණය වෙත භාර දීම සඳහා</u> අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට පියවර ගන්නා ලෙසත් <u>ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා අධිකරණ වෙත පූර්ණ සහයෝගය ලබා දෙන ලෙසත්</u> ඔබට දන්වන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මට නියම කර ඇත.

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOJ/L/72/2018 හා 2019.07.22 දිනැති ලිපියේ හා මෙකී කරුණ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව නිකුත් කළ 2019.10.29 දිනැති චක්‍රලේඛයේ පිටපත් මීට අමුණා ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

පිටපත්:

1. සියළුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ නිලධාරීන් - කරු. දැ. ගැ. පි සහ අ. ක. ස
2. රජයේ රස පරීක්ෂක - කරු. දැ. ගැ. පි.